**එක්සත් ජාතික පක්ෂය**
ஐக்கிய தேசியக் கட்சி
**United National Party**

# ප්‍රවෘත්ති නිවේදනය

එක්සත් ජාතික පක්ෂයේ (UNP) ඩිජිටල් පරිවර්තන යුගය ආරම්භ වෙයි

2026 පෙබරවාරි 04 වැනි දින සිරිකොත මූලස්ථානයේදී විශේෂ ඩිජිටල් දියත් කිරීම

එක්සත් ජාතික පක්ෂය (UNP) තම සංවිධාන ශක්තිය තාක්ෂණය සමඟ එක්කර ගනිමින්, නව ඩිජිටල් යුගයකට පා තබන විශේෂ ඩිජිටල් දියත් කිරීමක් 2026 පෙබරවාරි 04 වැනි දින සිරිකොත පක්ෂ මූලස්ථානයේදී පැවැත්වීමට නියමිතය.

මෙම අවස්ථාවේදී ශ්‍රී ලංකාව පුරා සියලුම මැතිවරණ කොට්ඨාශ ආවරණය වන පරිදි ඩිජිටල් පාලක සම්බන්ධීකාරකවරුන් (Digital Ward Coordinators) පත් කිරීම නිල වශයෙන් ආරම්භ කරනු ලබයි. එම අවස්ථාව වෙනුවෙන් මූලිකව පාලක සම්බන්ධීකරණ නිලධාරීන් 1000 දෙනෙකු මෙදින පත් කිරීම සිදු කරනු ලබයි. එමගින් පක්ෂ සංවිධාන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම, වේගවත් සහ ජනතාවට සමීප වීමට අපේක්ෂා කරයි.

ඊට අමතරව, එක්සත් ජාතික පක්ෂයේ නව UNP ජංගම යෙදුම (UNP App) ඉදිරියේදී නිල වශයෙන් හඳුන්වා දෙනු ඇත.  මෙම යෙදුම මගින් පක්ෂ සාමාජිකයන්ට, සංවිධායකයන්ට සහ ජනතාවට තොරතුරු හුවමාරු, දැනුවත් කිරීම සහ සම්බන්ධතා වර්ධනය කිරීම සඳහා නව ඩිජිටල් වේදිකාවක් සපයනු ඇත.

මෙම ඩිජිටල් දියත් කිරීමේ තවත් වැදගත් අංගයක් ලෙස, සිරිකොත පක්ෂ මූලස්ථානයේ Starlink අධිවේගී අන්තර්ජාල පහසුකම නිල වශයෙන් ආරම්භ කිරීමද සිදු කෙරේ. එය පක්ෂයේ ඩිජිටල් සන්නිවේදන හැකියාවන් වඩාත් ශක්තිමත් කරනු ඇත.

ජනතාවට සමීප, නවෝත්පාදන සහ තාක්ෂණය භාවිතා කරන දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීම එක්සත් ජාතික පක්ෂයේ මූලික අරමුණ වන අතර,මෙම ඩිජිටල් දියත් කිරීම ඒ දිශාවට ගත් වැදගත් පියවරක් වේ.

නිකුත් කළේ:

එක්සත් ජාතික පක්ෂය

නියෝජ්‍ය මහ ලේකම් කාර්යාලය

**මධ්‍යම කාර්යාංශය** மத்திய பணியகம் **Central Bureau**
"සිරිකොත මන්දිරය", 400, කෝට්ටේ පාර, පිටකෝට්ටේ, ශ්‍රී ලංකාව.
"சிறிகொத இல்லம்", 400 கோட்டே றோட், பிட்டகோட்டே, இலங்கை.
"Sirikottha House", 400, Kotte Road, Pitakotte, Sri Lanka.
Tel: 0112865374 / 0112865375 Fax : 0112865380
E-mail : gnunp@sltnet.lk Web : www.unp.lk

